
තරිඳුට
හොඳ
පාඩමක්.
ජී. සනුති සෙහාන්සා.

# තරිඳුට හොඳ පාඩමක්.

පි.සනුති සෙහන්සා.

කතෘගේ වෙනත් කෘති - ආඩම්බර සමනලයා

කෘතිය පළ කරන දිනය 2023.12.11

ISBN 978-624-206-918-0

**පිදුම.**

මාගේ දිවිය ආලෝකමත් කිරීමට නිරන්තර වෙහෙස වී මා ළඟින් හිඳ නිවැරදි මග පෙන්වන මාගේ මව සහ පියාටත්,

“දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතිය සඳහා මා යොමු කළ මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිනිය ශෂිකලා සේනාධීර මැතිනිය ඇතුළු ආදරණීය ගුරු මැණිවරුන් හා පියවරුන් වෙත.

පෙරවදන.

වත්මන් අධ්‍යාපනයේ ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත් වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවයන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීම අපේක්ෂාවයි. එසේනම් පාසලට වගකීම පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මග පෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරි කොට ගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂී ජයග්‍රහනයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිඟුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැලපෙන ලෙස නවීකරණය කරමින් “දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. දරුවන්ට අද්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතු වන වටිනාකම සලකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ “ දිවිය දිනන විද්‍යුත් පොතක් ” ව්‍යාපෘතියට එක් වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමඟින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කරමින් එයට ජීවයත් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි.

ශෂිකලා සේනාධීර<br>
විදුහල්පතිනිය<br>
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.<br>
2023.10.20


# තරිඳුට හොඳ පාඩමක්.

ඔන්න එක ඉස්කෝලෙක දඟ ළමයෙක් හිටියා. එයාගෙ නම තරිඳු. එයා හැමෝටම කරදර කළා.

කවුරුවත් කියන දේ ඇහුවෙ නෑ.

අම්මා, තාත්තා, ගුරුතුමී යාළුවෝ මේ කවුරුවත් කියන දේ තරිඳු ඇහුවේ නෑ.

අන්තිමේ එයා හරිම නරක ළමයෙක් කියලා පවුලේ අය අතර වගේම ඉස්කෝලෙත් ප්‍රසිද්ධ වුණා .



හැබැයි එයාගෙ හොඳම යාළුවෝ එයාට ආදරය කළා. ඒකෙන් උනේ තරිඳු තවත් දඟවුණ එක.

තරිඳුගේ අම්මා අදරයෙන් හොඳ නරක කියා දුන්නා. එත් තරිඳු කනකටවත් ගත්තෙ නෑ.

ඒ නිසා අම්මා සැරෙන් තරවටු කළා.

ඒත් ප්‍රයෝජනයක් උනේ නෑ.

තරිඳු ඉස්කෝලේ වැඩ හරියට කළේ නෑ. පාඩම් කළේ නෑ. ඒ නිසා පංතියේ අන්තිමයා වුණා.

ගුරුතුමී අවවාද කළා.

ඒවා අහන්න තරිඳු කැමති වුණේ නෑ.



තරිඳු කොහොම කෙනෙක් උනත් එයාගෙ හොදම යාළුවා නිපුන්, හැම වෙලාවෙම එයා හොඳ මඟට ගන්න උත්සාහ කළා. පංතියේ අනික් යාළුවෝ හැමෝම තරිඳු එක්ක තරහ වුණා.

දවසක් තරිඳු පාසලේ කොණක තිබුණ කොන්ක්‍රීට් තට්ටුවක් එසෙව්වා.

කොන්ක්‍රීට් තට්ටුව යට සිමෙන්තියෙන් බැඳපු ටැංකියක් තිබුණා.

පංතියේ යාළුවෝ, ගුරුවරු බය කරන්න හිතාගෙන තරිඳු ඒ ටැංකියට බැස්සා.



ඒ ටැංකිය වැසි ජලය ඉවත් කරන විශාල බටයකට සම්බන්ධ බව තරිඳු දැන ගෙන හිටියේ නෑ. තරිඳු ඒ බටය තුළට වැටුණා.

බටය දිගේ තරිඳු ලිස්සාගෙන ගොඩක් දුර ගියා. තරිඳු වටපිට බැලුවා.

තරිඳුට මොකුත් පෙනුනේ නෑ.

හැමතැනම කළුවරයි. තරිඳුට බය හිතුණා.

එයා හයියෙන් කෑගැහුවා.ඒත් කාටවත්ම ඒක ඇහුනේ නෑ. තරිඳු තදින් ඇස් පියා ගත්තා.

තරිඳුට අම්මා, තාත්තා,යාළුවෝ මතක් වුණා.

"කෝ මේ තරිඳු" නිපුන් පාසලේ හැම තැනම තරිඳුව හෙව්වා.

පංතියේ අනික් යාළුවොත් නිපුන්ට එකතු වුණා. ඒත් තරිඳුව හොයා ගන්න බැරි වුණා.

විවේක කාලය අවසන් වී සීනුව නාද වුණා. ළමුන් සියල්ලෝම  පංතියට ගියා.

තරිඳුගේ පුටුව හිස් බව දුටු ගුරුතුමී,

"නිපුන් කෝ... තරිඳු"

" අනේ ටීචර් ඉන්ටර්වල් එක දෙනකොටම අර පැත්තට ගියා. ආයෙ දැක්කෙ නෑ. අපි හැම තැනම බැලුවා." නිපුන් කිව්වා.

ගුරුතුමිය කලබල වුණා. පාසලේ අනෙක් ගුරුවරු, සිසුන් හා එක්ව පාසලේ හැම තැනම තරිඳුව හෙව්වා. පාසලේ තවත් හොයන්න තැනක් නැති වන තුරුම හෙව්වත් තරිඳුව හම්බවුනේ නෑ.

ඔය අතර පාසලේ කොනක තිබුණු කොන්ක්‍රීට් තට්ටුවක් එසවී ඇති ආකාරය නිපුන් දැක්කා. නිපුන්ට සැක හිතුණා.

“මේ කොන්ක්‍රීට් තට්ටුව මොකක්ද මාමේ ” නිපුන් දිව ගොස් පාසල මුර කරන මාමාගෙන් ඇසුවා.

“ඒක පුතේ..... එකතුවෙන වැහි වතුර අර ඈත ජේන වැවට ගෙනියන ලොකු වතුර බටයට සම්බන්ධ වෙන තැනක්” මුර මාමා කිව්වා.

නිපුන් ඈත බැලුවා. ගොඩක් ඈතින් වැවක් ජේනවා නිපුන් දැක්කා.

“ වැව තියෙන්නෙ ගොඩක් දුර. තරිඳු මේ බටේ දිගේ ගියා ද දන්නෙ නෑ.” නිපුන් සිතුවා.

පාසල නිම වී නිපුන් කල්පනා කරමින් පාර දිගේ වැව පැත්තට ගමන් කළා.

බටය දිගේ වේගයෙන් ලිස්සාගෙන ආපු තරිඳුට එළියක් පෙනුණා. බටයේ කෙළවරට ආසන්න බව තරිඳුට තේරුණා.

තරිඳු බටය දිගේ තල්ලු වී ඇවිත් දිය සිඳුණු වැලි මතට වැටුණා. වැසි නොමැති කාලයක් නිසා වැවේ වතුර පිරිල තිබුණේ නෑ. තරිඳු වට පිට බැලුවා.

" අනේ...... මේ කොහෙද? ඉස්කෝලෙ නෙවෙයිනේ. මං කොහොම ද දැන් ඉස්කෝලෙට යන්නේ. අම්මා මාව හොයනව ඇති"



තරිඳු වැවට වැටී ඇති බව තරිඳුට වැටහුනා. වැව් බැම්මෙන් උඩට එන්න උත්සාහ කළත් තරිඳු ට නොහැකි වුණා. තරිඳු අඬන්න පටන් ගත්තා.

වැව් ඉවුරෙහි හිමින් හිමින් ගමන් කරන නිපුන්ට කවුදෝ අඬන සද්දයක් ඇසුණා.

නිපුන් ඒ හඬ ඇසුණු පැත්තට ගියා. විමසිල්ලෙන් වට පිට බැලුවා. දුටු දෙයින් නිපුන් මවිතයට පත් වුණා.

"තරිඳු..........ඳු.......ඳු......." නිපුන් කෑ ගැහුවා.

තරිඳු උඩ බැලුවා. නිපුන්ව දැක්කා.

නිපුන් යුහුසුළුව අසල තිබූ ගසක එතී තිබුණ විශාල වැලක් ඇද එක් කෙළවරක් තරිඳු දෙසට විසි කළා. අනෙක් කෙළවර ගසෙහි එතුවා.

තරිඳු වැල අධාරයෙන් කෙමෙන් කෙමෙන් වැව් බැම්ම උඩට පැමිණියා. නිපුන් තම උපරිම ශක්තිය යොදා වැල උඩට ඇද්දා.

උඩට ආපු තරිඳු නිපුන්ව තදින් වැලඳ ගත්තා.

“ නිපුන්...ඔයාගෙ අත? තුවාල වෙලා. ලේ ගලනවා”

“කමක් නෑ. ඔයා බේරුණානේ. ” නිපුන් කිව්වා.

තරිඳුගේ ඇසින් කඳුළු වැටුණා.

එදායින් පසුව තරිඳු කවදාවත් නරක වැඩ කළේ නෑ.

දෙමාපියන්ට, ගුරුවරුන්ට කීකරු වී හොඳින් ඉගෙන ගත්තා.

- නිමි.-

# පසුවදන.



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමඟ සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතු කොටගෙන පොත පතින් දුරස් වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝදයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියා මූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තා තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අද්දැකීම් සමුදායක් ලබා දෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මග පෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසු වෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වුයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

“ දිවිය දිනන විද්‍යුත් පොතක් ” ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ලැබේවායි පතමි.

මෙයට,

සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කළ ව්‍යාපෘතියේ නිර්මාතෘ
2023.10.20